වත්තේගම නගර සභාව.
මහනුවර දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන.
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.
------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගැල්වනයිස් බට (GI) 150 ක වටිනාකම වූ රු.166,072 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සහනදායි පදනම මත අළෙවි කිරීමට තිබුණු රු.90,000 ක් වටිනා කොම්පෝස්ට් බඳුන් 150 ක වටිනාකම හිඟ හිටි ප්‍රාග්ධන ආධාර වශයෙන් ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙනවිත් තිබුණු රු.173,516 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිශ්චිතව හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ දී සමුච්චිත අරමුදලින් කපා හැර තිබුණි.

1.3.2 ලැබියයුතු ගිණුම්.
---------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 09 ක එකතු වටිනාකම රු.16,790,882 ක් වූ අතර, එයින් අවුරුදු 01 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ රු.6,698,170 ක ශේෂයන්ගෙන් රු.2,979,896 ක් 2015 ජූනි 30 දින වන විටත් අය වියයුතුව පැවතුණි.

2. මූල්‍ය සමාලෝචනය.
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,680,007 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.1,403,806 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.8,276,201 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2 මූල්‍ය පාලනය**

**-----------------**

**වත්තේගම ලංකා බැංකුවේ පවත්වා ගෙන ගිය ජංගම ගිණුම 2013 අප්‍රේල් මාසයේ සිට ගනුදෙනු කිරීමට යොදා ගෙන නොතිබුණු අතර, එහි පැවති රු.177,915 ක මුදල් ශේෂය එදින සිට නිෂ්ක්‍රීයව පැවතුණි.**

**2.3 ආදායම් පරිපාලනය.**

**---------------------**

**2.3.1 වරිපනම් බදු**

**--------------**

**පහත සදහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,351,469 ක හිග වරිපනම් බදු ශේෂයක් පැවතුණු අතර, එම ශේෂ තුළ වර්ෂ 01 ත් 11 ත් අතර කාලයක් තුළ ගෙවීම පැහැර හැර තිබූ බදුකරුවන්ගෙන් අය වියයුතු මුදලේ එකතුව රු.742,192 ක් වී තිබුණි.**

**(ආ) රජයේ ආයතන 06 කින් වර්ෂ 01 සිට වර්ෂ 12 ක කාලයක සිට රු.299,671 ක වරිපනම් බදු ශේෂයක් හිගව පැවතුණි.**

**2.3.2 කඩ කුළී**

**----------**

**පහත සදහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය වියයුතු හිග කඩ කාමර කුළිය රු.131,578 ක් වු අතර, ඉන් වර්ෂ 01 ට වැඩි හිග කඩ කාමර කුළිය රු.40,020 ක් වී තිබුණි.**

**(ආ) පොදු වෙළද පොළ ගොඩනැගිල්ලේ කඩ කාමර 58 න් කඩ කාමර 07 ක් ගොඩනැගිල්ල ඉදි කළ කාලයේ සිට වසා දමා තිබුණි. තව ද, පොදු වෙළද පොළ සංකීර්ණයේ කඩ කාමර 05 ක බදුකරුවන් හා සභාව අතර නීත්‍යානුකූල ගිවිසුමකට එළඹ නොතිබුණි.**

**(ඇ) කදුරට සංවර්ධන බැංකුව පිහිටි සභාවට අයත් ගොඩනැගිල්ලේ ඉහළ මහලේ කඩ කාමර 04 ක බදුකරුවන් විසින් බදු මුදල් අඛණ්ඩව ගෙවා ඇතත්, ගොඩනැගිල්ලේ මූලික පොදු පහසුකම් අවම වීම හේතුවෙන්, ව්‍යාපාර කටයුතු කිරීමකින් තොරව දිගින් දිගටම වසා දමා තිබුණි.**

**2.3.3 ජල ගාස්තු**

**--------------**

**පහත සදහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අය වියයුතු ජල ගාස්තුව රු.2,945,707 ක් වු අතර, ඉන් වර්ෂ 01 ත් 06 ත් කාල පරාසයක සිට හිග හිටි ජල ගාස්තු රු.636,972 ක් විය. ජල ගාස්තු සම්බන්ධයෙන් වු ගිවිසුමේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ජල ගාස්තු අය කිරීමට විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.**

**(ආ) මංගල ගිරි කන්ද හා පුංචි මෝල යන ජල ව්‍යාපෘති 02 හී ජල මනු සවි කර නොතිබුණු අතර, ජල පාරිභෝගිකයින්ගෙන් රු.200, රු.300 හා රු.350 ප්‍රමාණයන්ගෙන් ගාස්තු අය කර තිබීමෙන් ජල පාරිභෝගිකයින්ගේ ජල පාරිභෝජනයට සාපේක්ෂ ගාස්තු අය කිරීමේ ඉඩකඩ මග හැරී තිබුණි.**

**2.3.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් **2014** දෙසැම්බර් **31** දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.**1,623,937** ක් ලැබියයුතුව තිබුණ අතර, එම මුදලින් රු.**232,263** ක උසාවි දඩ මුදලක් **2015** ජූනි **30** දින වන විටත් එකතු කර ගෙන නොතිබුණි.

**2.3.5** පරිසර බලපත්‍ර ගාස්තු

-------------------------

**1988** අංක **56** සහ **2000** අංක **53** දරන පනත්වලින් සංශෝධිත **1980** අංක **47** දරන ජාතික පාරිසරික පනතේ **23** වගන්තිය හා **2008** ජනවාරි **25** දිනැති අංක **1533/ 16** දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව පරිසර බලපත්‍ර ලබා ගතයුතු ව්‍යාපාර **12** කට පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබීම හේතුවෙන්, රු.**48,000** ක බලපත්‍ර ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය.

---------------------------

**3.1** මානව සම්පත් කළමනාකරණය.

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තථ්‍ය සේවක සංඛ්‍යාව සමග සැසදීමේ දී පුරප්පාඩු තනතුරු **09** ක් පැවතින. ෙ

**3.2** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

-----------------------------------------

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතන වල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර උපකරණ බෙදා දීම යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය විසින් **2014** දෙසැම්බර් **19** දින **Foton Dating Track** රථයක් හා **2015** පෙබරවාරි **06** දින **Foton Ckroo Cab** රථයක් ලබා දී තිබු නමුත් මෙම රථ දෙක විගණන දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන සභා පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.**1,520,000** ක වටිනාකමට වැඩි වු වත්කම් වර්ග **06** ක් අවුරුදු **04** ත් **12** ත් අතර කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ දරු දැරියන්ට සුභ සාධන සේවයක් සැළසීම සඳහා දිගු කාලයක සිට සභාවේ පවත්වා තිබුණු කලා සංසදය **2014** වර්ෂයේ සිට අක්‍රිය වීම හේතුවෙන්, රු.**193,500** ක් පමණ වටිනා සංගීත භාණ්ඩ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) ගබඩාවේ රු.**43,863** කට වඩා වටිනා තොග විෂයයන් **35** කට අයත් ඒකක **1193** ක් වසර **01** සිට වසර **07** කට වඩා වැඩි කලක සිට නිකුත් නොවී නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.3** අධිකාරී බලය නොලත් ගනුදෙනු.

-----------------------------------

කසළ බැදුන් ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂය තුළ දි හා සමාලෝචිත වර්ෂය තුළ දි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ මගින් ලබා දුන් රු.**278,350** ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන අනුමැතියකින් තොරව පරිසර අරමුදලක් ගොඩ නගා තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

**-----------------------------**

**පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.ෙ**

**(අ) පැරණි නගර සභා පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම - වැය කළ මුදල රු.1,000,000**

**-----------------------------------------------------------------------------------------------------**

**i.** මීටර් 12 x 6.6 ප්‍රමාණයෙන් ඉදි කරන ලද ගොඩනැගිල්ලෙන් අර්ධයකට පමණක් අයිතම අංක 12 යටතේ මීටර් 6 x 6.6 ප්‍රමාණයෙන් බිම් උළු අල්ලා ඉතිරි කොටසට බිම් උළු අල්ලා නොතිබීම හේතුවෙන්, ගොඩනැගිල්ල ප්‍රායෝජනවත් කාර්යයකට යොදවා නොතිබුණි.

**ii.** පැරණි කොන්ක්‍රීට් වහළයේ එක් කොටසක මී.1.5xමී.2.00 ක ප්‍රමාණයක කම්බි දැල හා ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් කුළුණුවල කොන්ක්‍රීට් තට්ටුවෙන් **(Slab)** ඉහළට නිරාවරණය වන සේ ඉතිරි කර තිබූ කම්බි කිසිදු ආරක්ෂිත ද්‍රව්‍යයක් ආලේප නොකිරීම හේතුවෙන්, මළකමින් දිරා යැමට ඉඩ හැර තිබුණි.

**iii.** ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, පරිසර අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතනවල අනුමැතියකින් තොරව හා එකී ආයතන හදුන්වා දී ඇති නීති රීති හා නගර සභා ආඥා පනතේ විධිවිධානවලට අනුකූල නොවන ආකාරයට ප්‍රධාන ඇළ මාර්ගයක් මැදි කර, ඒ මත මෙම ගොඩනැගිල්ල ඉදි කර තිබුණි.

**(ආ) නගර සභා භූමියේ අඩක් නිම කළ ගොඩනැගිල්ල -වැය කළ මුදල රු.461,619**

**-------------------------------------------------------------------------**

නගර සභා භූමියේ වාහන නවතා තැබීම සඳහා 2008 වර්ෂයේ රු.461,619 ක් වැය කර අඩි 80 ක් දිගට හා අඩි 20 ක් පළලට අත්තිවාරම් කොන්ක්‍රීට් කර, අඩි 08 ක් උසට අඩි 01 ක ප්‍රමාණයෙන් කුළුණු 27 ක් සහිත ගොඩනැගිල්ලක් ඉදි කිරීම ආරම්භ කර, නිම නොකර, නවතා තිබුණි.

**(ඇ) බලහෙළ මාර්ගයේ මැද කොටස - වැය කළ මුදල රු.242,589**

**-------------------------------------------------------------**

ඇස්තමේන්තු ප්‍රකාරව **1: 2 ½ :5(මිමි25)** කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් මාර්ගය කොන්ක්‍රීට් කළයුතු වුවත්, 2015 පෙබරවාරි 25 දින මාර්ගය ස්ථාන කීපයකින් කඩා පරීක්ෂා කිරීමේ දි, පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දූර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා ඇති බවක් නිරීක්ෂණය වූ අතර, මාර්ගය එක් ස්ථානයක හරස් අතට ඉරි තලා පුපුරා ගොස් තිබුණි.

**(ඇ) අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් ඇල්ලීම නගර සභා බල ප්‍රදේශය අදියර - 01 වැය කළ මුදල රු.449,720**

**-----------------------------------------------------------------------------**

**i.** මාර්ගයේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් ඇතිරූ කොටසේ දෙපස ඉදි කර තිබුණු ආරක්ෂිත බැම්ම ඇස්තමේන්තු ප්‍රකාරව අගල් 09 ක් උසට ඉදි කළයුතු වුවත්, 2015 පෙබරවාරි 25 දින ස්ථාන කීපයක් පරීක්ෂා කිරීමේ දි එහි උස අගල් 04 ක ප්‍රමාණයක් විය.

ii. ආරක්ෂිත බැම් **1: 2 :4(මිමී20)** මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යොදා ඉදි කළයුතු වුවත්, ස්ථාන කීපයකින් කඩා පරීක්ෂා කිරීමේ දි, පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා තිබුණි. තව ද, මේ සඳහා ලැලි, වැලි හා ගල් ප්‍රවාහන වියදම් ඇතුළුව කොන්ක්‍රීට් ඝණ මීටර් 2.7 ක් සඳහා රු.58,995 ක් වැය කර තිබුණි.

(ඉ) නුවරතැන්න මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් ඇල්ලීම - වැය කළ මුදල රු.411,611

---

i. අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරූ මාර්ගයේ දෙපස ඉදි කර ඇති ආරක්ෂිත බැම් **(Curb Wall)** අගල් 09 ක් උසින් ඉදි කළයුතු වුවත්, ස්ථාන කීපයක් 2015 පෙබරවාරි 25 දින පරීක්ෂා කිරීමේ දි එහි උස අගල් 3½, 4 හා 5 ප්‍රමාණයක් ගෙන තිබුණි.

ii. ඇස්තමේන්තු ප්‍රකාරව ආරක්ෂිත බැම් **(Curb Wall) 1: 2 :4(මිමී20)** කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් ඉදි කළයුතු වුවත්, ස්ථාන කිපයක් කඩා පරීක්ෂා කිරීමේ දි, පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ ඉතා දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා තිබුණු නමුත්, එයට ඇස්තමේන්තු ප්‍රකාර රු.25,802 ක් ගෙවා තිබුණි.

(ඊ) අටල ගහගොඩ මාර්ගයේ පළුදු වූ ස්ථාන අළුත්වැඩියා කිරිම - වැය කළ මුදල රු.57,100

---

i. ගල් අතුරා තාර දමා ඉදිකර තිබුණු මෙම මාර්ගය බොහෝ ස්ථාන වල කැඩී බිඳී ගොස් පැවති බැවින් එම ස්ථාන හරි හතරැස් කර කැඩුණු ස්ථාන සකස් කිරීමකින් තොරව නගර සභාවේ ඍජු කම්කරු ශ්‍රමය භාවිතා කර අවිධිමත්ව කොන්ක්‍රීට් යොදා තිබුණු බවත් 2015 පෙබරවාරි 25 දින පරීක්ෂා කිරීමේදි නිරීක්ෂණය විය.

ii. ගල් අතුරා තාර දමන ලද මාර්ගයේ කැඩී බිඳී ගිය ස්ථාන පිළිසකර කිරිම සඳහා ගල් අතුරා තාර දැමීම සුදුසු වන බව නිරීක්ෂණය වුවත් එම කොටස් සඳහා කොන්ක්‍රීට් යෙදිම සම්බන්ධ තාක්ෂණ ක්‍රමවේදය පැහැදිලි නොවුනු අතර විගණන දිනය වූ 2015 පෙබරවාරි 25 දින වන විට අවිධිමත් ලෙස කොන්ක්‍රීට් තල ස්ථාන කිහිපයක පුපුරා ඉරි තලා කැඩී බිඳී තිබුණු බවක් නිරීක්ෂණය විය.

(උ) කොන්ත්‍රාත්කාර පාර්ශවය විසින් ඉදිකිරිම් වලට අදාළ බිල්පත් හා මිණුම් පත්‍ර සකස් කර ඉදිරිපත් කළයුතු වුවත්, ඊට පටහැනිව අධීක්ෂණය තාක්ෂණ නිලධාරින් විසින් බිල්පත් සකස් කර ඉදිරිපත් කර එම නිලධාරින් විසින්ම බිල්පත් නිර්දේශ කිරීමේ අවිධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි.

**3.5** ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.

---

සභා බල ප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ කිසිදු කළමනාකරණය කිරිමකින් තොරව සභාව සතු ඉඩමකට බැහැර කර තිබුණි.

**3.6** අවිධිමත් ගනුදෙනු

---

අඩු ආදායම්ලාභීන් වෙත බෙදාදීම සඳහා තහඩු මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීමේ දි, නගර සභාවට රු.26,875 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

**3.7** **සේවක ණය**

**--------------**

**නගර සභාවේ සේවය කරමින් සිට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරු වී ගොස් 2003 වර්ෂයේ සේවය අත හැර ගොස් තිබූ ලිපිකරු නිලධාරීවරයකුගෙන් රු.27,200 ක ණය මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**------------------------------------**

**4.1** **සංයුක්ත සැළැස්ම**

**------------------**

**සමාලෝචිත වර්ෂයේදී සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.**

**4.2** **ප්‍රසම්පාදන සැළැස්ම.**

**----------------------**

**රු.19,627,768 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3** **අභ්‍යන්තර විගණනය.**

**----------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** **සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**(ආ)** **සභාවේ අභ්‍යන්තර විගණන විෂය පවරා තිබුණු නිලධාරිනිය වෙත පරිසර නිලධාරී තනතුර හා කසළ කළමනාකරණය සම්බන්ධ කටයුතු ද පවරා තිබුණු බැවින්, අභ්‍යන්තර විගණන රාජකාරී කටයුතු ස්වාධීනව ඉටු කිරීමේ හැකියාවක් නොපවතින බවක් නිරීක්ෂණය විය.**

**(ඇ)** **අභ්‍යන්තර විගණනය තුළින් සභාවේ එදිනෙදා ගනුදෙනු පරීක්ෂා කර, කළමනාකරණයට සහාය වීම සඳහා විගණන වාර්තා නිකුත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණි.**

**4.4** **අයවැය පාලනය.**

**------------------**

**(අ)** **සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසදීමේ දි ආදායම් විෂයයන් 05 ක සියයට 17 සිට සියයට 81 ක් දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 11 සිට සියයට 74 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.**

**(ආ)** **ආදායම් ශීර්ෂ 02 ක් සඳහා අයවැයගත රු.20,595,000 ක් වූ ආදායම් උපයා ගැනීමට සමත් වී නොතිබුණි.**

**5.** **පද්ධති හා පාලනය.**

**---------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශ්ෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** **ගිණුම්කරණය**
**(ආ)** **අභ්‍යන්තර විගණනය**
**(ඇ)** **ආදායම් පරිපාලනය**
**(ඈ)** **වත්කම් කළමනාකරණය**
**(ඉ)** **කොන්ත්‍රාත් පරිපාලනය**